විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය    தலைமுறையொன்றின் பெருமிதம்    Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } විවැ/පා14/විවිධ/01    ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................    දිනය / திகதி / Date } 2020.10.16

සියලුම විශ්‍රාම වැටුප් නිලධාරීන් වෙත

**<u>සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධව 2020.09.18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012(IV) වෙත අවධානය යොමු කරවමි.

02. ඒ අනුව 2017.08.14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012(III) හි 02 හා 03 ඡේදයන්හි සඳහන් ප්‍රතිපාදනයන්ට යටත්ව සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කළ හැකි අවසාන දිනය 2020.11.30 දින දක්වා දීර්ඝ කර ඇත.

03. එබැවින් අන්තර්ග්‍රහණය සඳහා මනාපය පළ කරන මෙම දෙපාර්තමේන්තුව යටතේ සේවයේ නියුතු සියලුම විශ්‍රාම වැටුප් නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012 ප්‍රකාරව පහත ලේඛන 2020.11.30 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් "සහකාර අධ්‍යක්ෂ(මානව සම්පත්),විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,මාලිගාවත්ත,කොළඹ 10." ලිපිනයට එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

- සේවා ව්‍යවස්ථාවේ පළමු පරිශිෂ්ටයේ දැක්වෙන ආකෘතියට අනුකූලව සකස් කරන ලද අයදුම් පත්‍රය
- E-Hrm ආකෘතිය (මින් පෙර පෞද්ගලික ලිපිගොනුව වෙත ඉදිරිපත් කර නොමැති නම්)

04. තවද, උක්ත චක්‍රලේඛයේ පරිදි සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය සඳහා මනාපය පළ කරන ලද නිලධාරීන් හට එම ඉල්ලීම ඉල්ලා අස්කර ගැනීමට අවස්ථාව නොදෙන බව දන්වා ඇති බැවින් අන්තර්ග්‍රහණය කිරීම සඳහා අඩුපාඩු දන්වා එවා ඇති නිලධාරීන් අදාළ අඩුපාඩු කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසත් අවධාරණය කරමි.

කුෂානි බොරලැස්ස
අධ්‍යක්ෂ (පාලන)
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 10/2012(IV)

මගේ අංක : CS/DOS/Policy/06
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2020.09.18

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

## සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2012.05.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012, 2012.06.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012(I), 2016.04.04 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012(II) හා 2017.08.14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012(III) කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. 2017.08.14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012(III) හි 02 හා 03 ඡේදයන්හි සඳහන් ප්‍රතිපාදනයන්ට යටත්ව අන්තර්ග්‍රහණය සඳහා මනාපය පළ කළ හැකි අවසාන දිනය **2020.11.30** දක්වා දීර්ඝ කරමි.ඒ අනුව එදිනට පෙර අන්තර්ග්‍රහණය සඳහා මනාපය පළ කරන ලද සියලු නිලධාරීන්ගේ ලිපිගොනු 10/2012 චක්‍රලේඛයේ උපදෙස් පරිදි සකස් කර 2020.12.31 දිනට පෙර ලැබෙන සේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුය.

03. සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීමට අදාළව නිකුත් කර ඇති චක්‍රලේඛ විධිවිධාන යටතේ 2017.09.30 දිනට පසු මනාපය පළ කර ඇති හා මනාපය පළ කිරීමට අපේක්ෂා කරන නිලධාරීන් හට (මේ වන විට විනය පරීක්ෂණ වලට භාජනය වී ඇති නිලධාරීන් හැර) සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මෙමඟින් අවස්ථාව හිමි වේ.

04. තවද සංවර්ධන නිලධාරී සේවයට **අන්තර්ග්‍රහණය සඳහා මනාපය පළ කරන ලද නිලධාරීන් හට එම ඉල්ලීම ඉල්ලා අස්කර ගැනීමට අවස්ථාව ලබාදීමට හැකියාවක් නොමැති** බව කාරුණිකව දැනුම් දෙන අතර එම සියලුම නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

## පළමු පරිශිෂ්ටය

වැඩසටහන් නිලධාරී සේවය
අන්තර්ග්‍රහණය සඳහා ඉල්ලුම් පත්‍රය
*I කොටස - අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුයි.*

1. සේවා ස්ථානය සහ ලිපිනය : ................................................................................................................
................................................................................................................

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ................................................................................................
................................................................................................මෙනවිය/මහත්මිය/මහතා*

(i) උපන්දිනය : ................................ (ii) සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට වයස : .............................

4. දැනට දරන තනතුර : ................................................................................................

5. පත්වීමේ ස්වභාවය :

5.1 තනතුරට අදාළ මුල් පත්වීමේ දිනය : ............................................................

5.2 වර්ෂ 1994 සිට ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින දක්වා (2011.08.01) කාලය තුළ උපාධිධාරීන්ට රැකියා ලබාදීමේ රජයේ ප්‍රතිපත්තිය යටතේ පත්වීම් ලැබුවෙක්ද යන්න සඳහන් කරන්න : ......................................................................

5.3 ඉහත 5.2 පරිදි හැර වෙනත් ආකාරයකින් පත්වීම් ලැබුවන් නම් එහි ස්වභාවය සඳහන් කරන්න
................................................................................................................

6. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/2004 අනුව,
1. වැටුප් පරිමාණය : ..........................................
2. වැටුප් කේත අංකය : .............................................

7. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව,
1. වැටුප් පරිමාණය : ..............................................
2. වැටුප් කේත අංකය : ...........................................
3. 2011.07.31 වැනි දිනට
(අ) වැටුප් තලය : රු ........................................
(ආ) වැටුප් පියවර අංකය : .......................................

8. දැනට සිටින තනතුරට බඳවාගැනීමේ පටිපාටිය අනුව දැනට දරන තනතුරට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් :
................................................................................................................

9. රාජකාරී විස්තරය (සැකෙවින්) : ................................................................................................
................................................................................................................

10. දැනට සිටින තනතුරට බඳවා ගනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටිය අනුව නියම කර ඇති කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් වූ දිනයන් :

| | *කාර්යක්ෂමතා කඩඉම් විභාගය* | *සමත් වූ දිනය* |
|---|---|---|
| 1. | .......................................... | .......................... |
| 2. | .......................................... | ............................ |
| 3. | .......................................... | ............................ |

11. සේවා කාලය පිළිබඳ විස්තරය (අවශ්‍ය වේ නම් ඇමුණුමක් භාවිතා කරන්න)

| සිට | දක්වා | තනතුර | සේවා ස්ථානය | සේවා කාලය (අවුරුදු) |
|---|---|---|---|---|
| | | | | |

12. ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය : ................................ ..........................................
අයදුම්කරුගේ අත්සන

*2 කොටස - ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුයි.*

13. අයදුම්කරු විසින් 1 සිට 11 දක්වා සඳහන් කර ඇති තොරතුරු නිවැරදි අතර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් වැටුප සඳහා නිර්දේශ ලබා දුන් ලිපියේ පිටපතක්ද ඉදිරිපත් කරමි. ඔහු/ඇය* මෙම සේවයට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි./නොකරමි*. (නිර්දේශ නොකරන්නේ නම් හේතු සඳහන් කළ යුතුයි.)

.....................................
දිනය.

....................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

*3 කොටස - ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රයෝජනය සඳහා*

14. අයදුම්කරු / අයදුම්කාරිය* මෙම සේවයට අන්තර්ග්‍රහණය කරමි/නොකරමි. *

15. අන්තර්ග්‍රහණය නොකරන්නේ නම් ඊට හේතු : ....................................................................................
....................................................................................................................................................
....................................................................................................................................................

16. අන්තර්ග්‍රහණය කරනු ලබන ශ්‍රේණිය : ...........................................

.....................................
දිනය

.....................................................................
බලය පැවරුණු නිලධාරියාගේ අත්සන.

* අනවශ්‍ය වචන කපා හරින්න

03 - 44

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.